**මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අදියර 02 -2021**

-----------------------------------------------------------------------------

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන- අදියර 02 හි 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2018 මැයි 18 වන දින එළඹි ණය ගිවිසුම් අංක 3625 – (එස්ආර්අයි) හි 4.02(අ) වගන්තිය සහ ණය ගිවිසුම් අංක 3626 – (සීඕඑල්) හි 4.02(අ) වගන්තිය ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාල සීමාව

-----------------------------------------------------------------------------

වැඩසටහනේ ණය ගිවිසුම් අනුව, වාරිමාර්ග අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැඩසටහනෙහි ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. වැඩසටහන ක්‍රියාත්මක කරන ප්‍රදේශයේ කෘෂිකාර්මික හා පානීය ජල අවශ්‍යතා සඳහා ජල සම්පත වෙත ප්‍රවේශවීම තහවුරු කිරීම වැඩසටහනේ අරමුණ වේ. ණය ගිවිසුම් අනුව, වැඩසටහනෙහි ඇස්තමේන්තුගත මුළු පිරිවැය ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 242කට සමාන රුපියල් මිලියන 43,734ක් වූ අතර, ඉන් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 210 කට සමාන රුපියල් මිලියන 37,951ක් ආසියානු සංවර්ධන බැංකුව මගින් මූල්‍යායනය කිරීමට එකඟත්වය පළ කර ඇත. රුපියල් මිලියන 5,783ක ඉතිරි මුදල ශ්‍රී ලංකා රජය මගින් මූල්‍යායනය කිරීමට අපේක්ෂා කර ඇත. මෙම වැඩසටහනෙහි කටයුතු 2018 ජූලි 23 දින ආරම්භ කරන ලද අතර 2024 ජූනි 30 දින වන විට එය නිම කිරීමට නියමිත ය.

## 1.3 මතය

-------

වැඩසටහනෙහි මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

--------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනෙහි මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- වැඩසටහනෙහි අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 කොන්ත්‍රාත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යූර්සීපී-අයිසීබී-2බී පැකේජය 2021 සැප්තැම්බර් 10 වන දින නිම කිරීමට නියමිත අතර, එය 2022 මැයි 28 දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේනමුත්, 2021 දෙසැම්බර් 31 වන විට එහි භෞතික ප්‍රගතිය සියයට 70ක් පමණක් විය. | 2020 හා 2021 වර්ෂවලදී විවිධ කොවිඩ් 19 ප්‍රභේද රැළි කිහිපයක් රටට බලපෑම සහ ඇඳිරි නීතිය හා රට අගුළු දැමීම් මගින් රජය පැනවූ සංචරණ සීමා | කොන්ත්‍රාත් විචලනයන් අවම කිරීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ආ) | වයඹ ඇළ යටතේ මහකිතුල ඇතුළත උමග, මහකිතුල හා මහකිරුල ජලාශ සහ මහකිතුල හා මහකිරුල ජලාශවල සිට පෝෂණ ඇළ ඉදිකිරීමට 2021 දෙසැම්බර් 31 දිනට සියයට 23ක භෞතික ප්‍රගතියක් අපේක්ෂා කළද, සියයට 03ක ප්‍රගතියක් පමණක් ළඟා කරගෙන තිබුණි. | අධීක්ෂණ මට්ටමේ යෝජ්‍ය තනතුරු සඳහා සුදුසුකම්ලත් සහ අත්දැකීම් සහිත කාර්ය මණ්ඩලයක් සහ තත්ව පාලන කාර්ය මණ්ඩලයක් නොමැති වීම හා සන්නිවේදන පරතර පැවතීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු හොඳින් ක්‍රියා කර නොතිබුණි. | කොන්ත්‍රාත් විචලනයන් අවම කිරීම සඳහා කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අදියර 03 2018 සිට 2024 දක්වා ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර තිබුණද, 2021 දෙසැම්බර් 31 දින දක්වා අනුමැතිය ලබාගෙන නොතිබුණි. එබැවින් අදියර 03 යටතේ රුපියල් මිලියන 74,470ක් වටිනා කොන්ත්‍රාත් පැකේජ 09ක් තවමත් ප්‍රදානය කර නොතිබුණි. ඉන් කොන්ත්‍රාත් පැකේජ 05ක් 2021 වර්ෂය තුළදී ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර තිබුණි. කෙසේවුවද, රුපියල් මිලියන 48ක බැරකම් ගාස්තු සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | අදියර 03 ක්‍රියාත්මක වීම වාරික ගෙවීම් මූලික සැකසීමක් මත පදනම් වන බව එනම්, අදියර 02 හි සියයට 75ක් පමණ ගෙවීම් කළ විට අදියර 03 ක්‍රියාත්මක වීමට පටන් ගනු ලබන බව 2020 නොවැම්බර් 02 සිට දෙසැම්බර් 11 දක්වා පැවැත් වූ විශේෂ පරිපාලන මෙහෙයුම, ඒඩ් මෙමොරේ (AIDE Memoire), විශේෂයෙන් සඳහන් කර තිබුණි. | කොන්ත්‍රාත් විචලනයන් අවම කිරීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2019 – 2020 තුළදී ක්‍රියාත්මක කිරීමට සැළසුම් කළ සමෝධානික ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ උපදේශන සේවා 2021 දෙසැම්බර් 31 දින වනවිටත් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, එම ව්‍යාපෘතිය 2021 ක්‍රියාකාරී සැලැස්මට ද ඇතුළත් කර නොතිබුණි. | සම්බන්ධිත පාර්ශව හා ණය ලබාදෙන ආයතනය සමඟ පැවති සාකච්ඡා වට කිහිපයකින් පසුව කෙටුම්පත් නිර්ණායක පරිශීලනය මේ වන විට අවසන් කර ඇති අතර, 2022 වර්ෂය අවසානයේදී ප්‍රසම්පාදනය සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය. අධ්‍යයනය 2024 වර්ෂය අවසානයේ දී සම්පූර්ණ කරනු ඇත. | ප්‍රමාදයකින් තොරව අදාළ කාල සීමාව අනුව උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කළ යුතුය. |